# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,107—1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්ද—14.4.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදී)

## II කොටස—අධිකරණ

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි.)



| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මිත වූ පණත් ... ... ... | — | පිස්කල් විකිණීම් ... — — | — |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | 15 | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... — | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... — | — |
| වස්තුභංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | නොතාරිස් ලැයිස්තුව ... — | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම් ... ... | — | විවිධ දැන්වීම් ... — — | — |



## ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට දකුණු දිසාව සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1960 ක්වූ අප්‍රේල් මස 25 වන දින පෙරවරු 11 ට ගාල්ලේ ශ්‍රෙෂ්ඨාධිකරණ ශාලාවේ දී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාට ම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

සී. ජේ. සේරසිංහ,
පිස්කල්, දකුණු පළාත.

වර්ෂ 1960 ක්වූ අප්‍රේල් මස 7 වන දින,
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

15—ජේ. ඇන්. බී 22828—1,322 (4/60)